# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2086/11 – 2018 අගෝස්තු 28 වැනි අඟහරුවාදා – 2018.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සබරගමු මහ සමන් දේවාල ඇසළ උත්සවය - 2018**

362 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥා පනත යටතේ පළකර ඇති අංක 1563 2008.08.15 වන දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් ඉළුක්කුඹුර රත්නායක මුදියන්සේලාගේ ප්‍රදීපිකා දමයන්ති ඉළුක්කුඹුර වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2018 සබරගමුව මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත නියෝග පවරමි.

01. මෙවර සබරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සවය 2018 වර්ෂයේ සැප්තැම්බර් 08 වන දිනෙන් ආරම්භ වී සැප්තැම්බර් මස 26 වන දින දියකැපීමේ මංගල්‍යය සහ දහවල් පෙරහැරින් පසු අවසන් වන බව දැනුම් දෙමි.

02. උතුරට වැසියන් පදිංචි පරවේනි තිලකරුවන්ගේ ඉඩම් රථගාල් හා සල්පිල් භූමිය පෙන්වන සිමෙන්ති කාණුව හා රථගාලට ඇතුළු වන පාර ද, දකුණට තෙන්නගේවත්ත හා කලු ගඟ ද, නැගෙනහිරට රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට දේවාලය සතු මහ උයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ. රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල්කඩේ සිට කොටඹේ දක්වා ගමන් කර එතන සිට මාර්ගය ඔස්සේ කළුගඟ දක්වා කළුගඟ ඔස්සේ රත්මල ඇල්ල දක්වා ගමන් කර එම ස්ථානයේ දී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණීම දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ.

03. දේවාල භූමිය, වැලි මළුව, හුණුවල වීදිය හා කුරුවිට ගම්පහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදිය අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.


1A – G 028367 – 12 (2018/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04. පෙරහැර දින පහ සඳහා සල්පිල් භූමියේ පිහිටි ස්ථිර මල්කඩ හය, තාවකාලික වෙළෙඳ සැල් හා සල්පිල් භූමිය තාවකාලික වෙළෙඳ සැල් 200ක් සඳහා මා මවිසින් වෙන්දේසි කර අවසන් කර ලබා දෙන බව දන්වමි. මෙම වෙළෙඳ සැල්හි මල් හඳුන්කූරු, ඉටි පන්දම, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප රස කැවිලි, විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසර දෙමි.

05. අංක 04හි සඳහන් සල්පිල් භූමියෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළෙඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

06. රථගාල් පරිශ්‍රය හැර උත්සව භූමියෙහි ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථවාහන මගින් හෝ කඳවුරු භාර නිලධාරි තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුල් කිරීම තහනම් කරමි.

07. රත්නපුර - පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල්කඩ තුළින් දේවාල පූජා භූමියට වාහන ඇතුළත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළෙඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. වෙන්දේසි කරන ලද වෙළෙඳ බිම්වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් ලබා ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියළුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. රත්නපුර ප්‍රාදේශීය ලේකම් මගින් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

### 15 වන ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්තැනගේ අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර තනන්නා වූ හෝ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම් කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිළධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

(ඇ) සමන් දේවාල පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාලය සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියළුම මත්ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

අයි. ආර්. එම්. ප්‍රදීපිකා ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2018 අගෝස්තු මස 21 වැනි දින,

09 - 241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.